# වැහි බිඳුවක ගමන



ද්වානා රත්නායක

# වැහි බිඳුවක ගමන

ද්වානා රත්නායක

# වැහි බිඳුවක ගමන


## ද්වානා රත්නායක



**ISBN 978-624-206-739-1**


**කතෘගේ වෙනත් පොත් - සමනල පැටියා**

**වී ඇටයක කතන්දරේ**

**2023-12-18**

# <u>පිදුම</u>

මාගේ ආදරණීය තාත්තාටත්, අම්මාටත්,

හැමවිටම මා දිරිමත් කරනා

මාගේ අත්තම්මාටත්,

මාගේ දඟ මල්ල නංගී අමීටත්, චූටි මල්ලී එවීටත්

ඉතා සෙනෙහසින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශණයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .


එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැලපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල්වල දරුවන් යොමුකල විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කල සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
**විදුහල්පතිනිය**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**
**2023.11.01**

අහස කළු වලාකුළු වලින් පිරුණා.
සුළඟ වේගයෙන් හැමුවා. පරිසරය සීතල වුණා.
ඉර මාමා වලාකුළු වලට වැහුණා. අහස ගෙරෙව්වා. විදුලි කෙටුවා.
"වැස්ස වහින්න ළඟයි" ඉර මාමා කියනවා මට ඇහුණා.
මගේ යාළුවෝ බිමට වැටුණා. මටත් යන්න ආස හිතුණා.
මම වලාකුළෙන් බිමට පැන්නා.





"ජබොහ්" මම පුංචි වතුර වලකට වැටුණා.
මම වටපිට බැලුවා.
මා ළඟම හිටියා හිනාවෙවී ලස්සන මල් යාළුවෝ දෙන්නෙක්.
එයාලා මට කීවා මමත් මගේ යාළුවොත් එයාලාට
ගොඩක් උවමනායිලු. එයාලට අපි නැතුව ඉන්න බැරිලු.
මගේ යාළුවොත් ඒ පුංචි වලට වැටුණා.
මගේ ඇඟටත් වැටුණා.



ඊට පස්සේ මල් යාළුවෝ හිටපු පැළවලට
හරිම තිබහයි කියලා මගේ යාළුවන්ව උරා බීවා.
මම යන්තම් බේරුණා. මම ඇහුවා මල් යාළුවන් හිටපු පැළ වලින්
"ඇයි මගේ යාළුවන්ව උරා බීවේ" කියලා.








තවත් මගේ පුංචි යාළුවෝ ඒ වතුර වලට එකතු වුණා.
පුංචි වතුර වල පිටාර ගැලුවා.
අපි ඔක්කොම පෙරළි පෙරළි දිය පාරකට එකතු වෙලා
පහළට රෝල් වෙලා ගියා.

අපි ගස්වල, මුල්වල, ගල්වල හැපි හැපී පහළට ගලාගෙන ගියා.
වැස්ස තවමත් වහිනවා අපි ගිහින් ලොකු ගඟකට වැටුණා.
අපි සතුටින් උඩ පැන පැන නැටුවා.





වැස්ස නැවතුනා.

ඉර මාමා තදින්ම පැවුවා.

වැස්ස නිසා එයාට පොළොවට

එබී බලන්න බැරිවුන තරහට වගේ

තව තව රස්නිය වැඩි කළා.

ඉර මාමා මගේ යාළුවන්ව

වාෂ්ප කරලා ඉහළට ඇද ගත්තා.




මම තවත් යාළුවොත් සමඟින් ගඟ දිගේ
දිගටම ගලාගෙන, ගලාගෙන, ගලාගෙන ගිහින්
මුහුදට වැටුණා. මට හරිම පුදුමයි!
මුහුද ගොඩක් ලොකුයි.
වතුර මහ ගොඩක් තියෙනවා. රැල්ලත් ගහනවා.
නිල්ම නිල් පාටයි. මට ගොඩක් යාළුවෝ හමුවුණා.
අපි ඔක්කොම සතුටින් පෙරළි පෙරළි හිටියා.





අපිට වැඩි වෙලාවක් සතුටින් ඉන්න බැරි වුණා.
ඉර මාමා ආයෙමත් තදින්ම
රැස් විහිදෙව්වා.
රස්නිය වැඩි වුණා.
අනේ මටත් වාෂ්ප වෙලා
ඉහළට යන්න සිදු වුණා.



ඉහළ අහසට ගිහින් වලාකුළකදී මමත් යාළුවන්ට එකතු වුණා.
මට දුක හිතුණා. මගේ යාළුවෝ කිවුවා
"පරිසරය සීතල වුණාම, සුළඟ තදින්ම හමනකොට,
වැස්ස වහිනකොට, මට ආයෙමත් වලාකුළෙන්
වතුර බිංදුවක් වගේ පොළොවට එන්න පුළුවන්" කියලා.

... නිමි ...



# <u>පසුවදන</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්ව පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මාවිසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනාකරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘතිය රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් හා පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට
**සෙනෙවිරත්න මහලේකම්**
**පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක**
**2023.11.01**